# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/20 – 2011 ජූලි 15 වැනි සිකුරාදා – 2011.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ අංකය: 3/2/ඉඅත්/167.

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්/ඩී/05/2006/එච්ඩබ්/96.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

පී. පී. කො. 8868

කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදපත්තුව සුළු කොට්ඨාසයේ බොරලුගොඩ ගමේ පිහිටි පහත නම් සඳහන් ඉඩම් කොටස් 04ට මායිම්.

**කැබලි අංක 01**

ඉඩමේ නම: බොරලුගොඩලන්ද; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගෙඩනැගිලි 03ක් හා තාවකාලික ගොඩනැගිල්ලේ කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.1150.

**කැබලි අංක 02**

ඉඩමේ නම: සාලාව වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.4837.

**කැබලි අංක 03**

ඉඩමේ නම: බොරලුගොඩලන්ද; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0668.

**කැබලි අංක 04**

ඉඩමේ නම: බොරලුගොඩලන්ද; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0212.

මුළු ප්‍රමාණය: හෙක්. 0.6867.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2011 සැප්තැම්බර් මස 21 වැනි දින පූ. භා. 10.00ට සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 සැප්තැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේ දී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

පී. ඩී. එස්. විජේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
සීතාවක.

2011 ජූලි මස 11 වැනි දින,
සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 724

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: 3/3/4/15.

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2007/වීඊපී/224.

උක්ත ශීර්ෂය යටතේ 2011 මාර්තු 07 වැනි දින ම විසින් අංක 1693/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 03 - 617 යටතේ පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සිංහල හා දෙමළ භාෂාවලින් පළකරන ලද අංක නු. 2512 යන මූලික පිඹුරේ අංකය නු. 2521 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ජී. කේ. ජී. ඒ. ආර්. පී. කේ. නන්දන,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2011 ජූලි මස 07 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 719

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ යොමු අංකය: පවි/ඉ/1/2/අත්/13.

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2001/එෆ්ආර්/128.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1682/14 හා 2010.11.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද මාගේ දැන්වීමේ හිමිකම් පරීක්ෂණ පැවැත්වෙන දිනය 2010.12.22 වශයෙන් සඳහන් වුවද, එය 2011 අගෝස්තු 10 වැනි දින යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

* අයිතිවාසිකම් දැක්විය යුතු දිනය 2010 දෙසැම්බර් 15 යන්න 2011 අගෝස්තු 01 යනුවෙන් ද

* හිමිකම් පරීක්ෂණ පැවැත්වෙන දිනය 2010 දෙසැම්බර් 22 යන්න 2011 අගෝස්තු 10 යනුවෙනි.

ආර්. කේ. ජී. ඩී. කේ. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
පන්විල.

2011 ජූනි මස 24 වැනි දින,
පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 720

## සංශෝධනය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ අංකය: 4/4/1-1/3(වෙළම).

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාලේවන, නාකන්දලගොඩ, වරාපිටිය සහ කොටපිටිය යන ගම්වල අංක ක. 4312 දරන මූලික පිඹුරට අයත් ඉඩම් සම්බන්ධයෙන් අංක 1711/10 හා 2011.06.21 දිනැති රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ හිමිකම් පරීක්ෂණ පැවැත්වීමේ දිනය 2011.08.17 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ අනුව හිමිකම් පෑමේ හා වන්දි ඉල්ලුම් කිරීමේ ලියවිලි එවිය යුතු අවසාන දිනය 2011.08.10 දින ලෙස ද දීර්ඝ කරනු ලැබේ.

ධම්මික රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2011 ජූලි මස 13 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 744

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: ව/18/67/2003.

මා විසින් 2006 නොවැම්බර් 06 වැනි දින අංක 1470/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසෙහි පළකරන ලද ඉඩම් රජයට අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 175, තෙළඟපාත, තෙළඟපාත යන ගමෙහි පිහිටි ගම්. 3535 මූලික පිඹුරේ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි දෙක.

01. **කැබලි අංක 41**
ඉඩමේ නම: කහටගහවත්ත, කැටකැලගහවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. එස්. විජේසිංහ, අංක 146, තෙළඟපාත පාර, වත්තල; ප්‍රමාණය: හෙක්. 0.0014.

02. **කැබලි අංක 42**
ඉඩමේ නම: කහටගහවත්ත, කැටකැලගහවත්ත; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. වීරරත්න, අංක 144, තෙළඟපාත පාර, වත්තල; ප්‍රමාණය: හෙක්. 0.0001.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2011 ජූලි මස 05 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 11

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.